දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA
තැ.පෙ.43/தபால் பெட்டி 43 /**P.O.Box 43**
පරණ ගලහ පාර, පේරාදෙණිය, ශ්‍රී ලංකාව
பழைய கலகா வீதி, பேராதனை, இலங்கை
Old Galaha Road, Peradeniya, Sri Lanka

මගේ අංකය
எமது இலக்கம்
**My Ref:**

ඔබේ අංකය
உமது இலக்கம்
**Your Ref:**

2022-03-30

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් වෙත,

<u>උපාධි ප්‍රදානෝත්සවය (බාහිර) - **2019**</u>

ප්‍රිය උපාධි අපේක්ෂකයිනි,

**01** 2019 දෙසැම්බර් මස පවත්වන ලද කලා අවසන් උපාධි පරීක්ෂණයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සමත් වූ උපාධි අපේක්ෂකයන් සහ 2019 දෙසැම්බර් මස පවත්වන ලද ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පරීක්ෂණයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සමත් වූ උපාධි අපේක්ෂකයන් සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය 2022 මැයි මස 26 වන දින පේරාදෙණිය විශ්ව විද්‍යාලයේදී පැවැත්වීමට නියමිතය.

**02** මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලැබීමට සුදුසුකම්ලත් උපාධි අපේක්ෂකයන් මේ සමඟ එවා ඇති අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරුවල දෝෂ ඇත්නම් ඒවා නිවැරදි කර **2022-04-20** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"<u>උපාධි ප්‍රදානෝත්සවය (බාහිර) - 2019</u>"** යනුවෙන් සඳහන් කර **"<u>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය</u>"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. තවද මෙයට සමගාමීව මේ සම්බන්ධව CDCE වෙබ් අඩවියේ උඩුගත(upload) කර ඇති google ෆෝරමය පිරවීමද අනිවාර්යය වේ.

**03** සහතික පත්‍ර ගාස්තු සහ උපාධි ප්‍රදානෝත්සවයේ අනෙකුත් වියදම් ආවරණය කර ගැනීම සඳහා **රු. 5000/-** ක් වන ගාස්තුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් **පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අංක** **<u>057-1-001-4-1338036</u>** දරන ගිණුමට බැර කර මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සියේ **(Orginal Cash Deposit Slip)** මුල් පිටපත සමඟ ඔබ වෙත එවන ලද අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 දක්වා තොරතුරු සම්පූර්ණ කර එවිය යුතු වේ. **(අයදුම් පත්‍රයේ අංක 06 යටතේ, ඔබගේ ක්‍රියාකාරී දුරකථන අංකයක් සඳහන් කර එවීම අනිවාර්යය වේ)**. තවද රු. 50.00 ක් වටිනා මුද්දර අලවන ලද නම සහ ස්ථිර ලිපිනය ලියූ සෙ.මී. 22x10 (9"x4") ප්‍රමාණයේ ලියුම් කවර 2 ක් ඒ සමඟ අමුණා එවිය යුතුය.

❖ ඔබ විසින් අයදුම් පත්‍රයේ අංක 06 යටතේ සඳහන් කරනු ලබන දුරකථන අංකය වෙත උපාධි උත්සවයට අදාල SMS පණිවුඩ දැනුම්දෙනු ලබන අතර එම අංකය නොවෙනස්ව පවත්වා ගෙන යන ලෙස දන්වා සිටිමි.

❖ තවද උපාධි ප්‍රදානෝත්සවයට අදාල විස්තර ඉදිරියේදී අපගේ **www.pdn.ac.lk/cdce** වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

පී.අයි.අයි. පතිරණ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
ලේඛකාධිකාරී වෙනුවට

පී. අයි. ඉරාණි පතිරණ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දුරකථන/தொலைபேசி/Telephone :*0812388057, 0812392201, 0812392209, 0812392210, 0812392222*
ෆැක්ස්/ பெக்ஸ்/Fax : 0812389206 වෙබ් අඩවිය/இணையத்தளம்./Web site: www.pdn.ac.lk/cdce